මොරවැව ප්‍රාදේශීය සභාව
-----------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
---------------------------

1 මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 ජූලි 11 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 09 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම වූ රු. 554,436 ක් ගිණුම්වලට නොගැනීමෙන් ප්‍රවර්ථන වර්ෂයේ ආදායම එම අගයෙන් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) සභාවේ නිලධාරීන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ලබාදෙන ලද අත්තිකාරම් නිරවුල් කර තිබියදීත් ශේෂ පත්‍රයේ අත්තිකාරම් ලෙස රු. 108,016 ක ඍණ ශේෂයක් පෙන්නුම් කර තිබුණි.

(ඇ) 2015 සහ 2016 වර්ෂයන්ට අදාලව දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය සඳහා ගෙවිය යුතු පොලී රු. 933,151 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයට අදාලව 2015 වර්ෂය තුලදී ගෙවන ලද ණය පොලී වූ රු. 773,575 ක් සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර ණය ගිණුමට හර කිරීමෙන් සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ගිණුම්ගත කිරීමේ දී මෝටර් රථ හා කරත්ත ගිණුමේ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායම් දායකය ගිණුමේ ශේෂයන් රු. 6,390,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී රු. 15,197,362 ක් වටිනා ගොඩනැඟිලි ඉදිකිරීම් සිදුකර ඇතත් ශේෂ පත්‍රයේ එය රු. 11,149,172 ක් ලෙස දක්වා තිබීමෙන් ඉඩම් හා ගොඩනැඟිලි වටිනාකම රු. 4,048,190 ක් අඩුවෙන් අවසන් ගිණුම්වල දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

(අ) 2016 දෙසැම්බර් 31 දිනට සේවක ණය ලේඛනයට අනුව රු. 1,342,228 ක් වුවද, ශේෂ පත්‍රය අනුව එය රු. 1,051,721 ක් වූ බැවින් රු. 290,507 ක වෙනසක් පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය තැන්පතු ලෙජරය අනුව රු. 508,977 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.783,.010 ක් වූ බැවින් රු. 274,033 ක වෙනසක් පැවතුණි.

1.3.3 අවිනිශ්චිත ගිණුම
-------------------

2011 වර්ෂයේ සිට පැවත එන රු. 7,864,759 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන ශේෂ පත්‍රයේ වගකීම් යටතේ දක්වා තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම
----------------------------------------

රු.950,536 ක් වූ ලැබිය යුතු ගිණුම් හා රු.214,316 ක් වූ ගෙවිය යුතු ගිණුම්වලට අදාල ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 නීති,රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම්
----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති,රෙගුලාසි සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 1646 | ගමන් පිළිබඳ මාසික සාරාංශ මුල් පිටපත් සමඟ දෛනික ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 09 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) 1989 අප්‍රේල් 17 දින අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| i. 143 වැනි රීතිය | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල්, පුස්තකාල තැන්පතු සහ අනෙකුත් තැන්පතු වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් තැන්පතු ගිණුම් ආරම්භ කර නොතිබුණි. |
| ii. 217 වැනි රීතිය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

02. මුල්‍ය සමාලෝචනය

2.1 මුල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,801,448 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 3,612,963 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිපලයෙහි රු. 8,414,411 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව කුලී ආදායම් රු. 4,569,142 කින් හා වෙනත් ආධාර රු.3,556,046 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලය රු. 8,414,411 කින් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු..000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 47 | 53 | - |
| බදු කුලී | 2,785 | 4,596 | 46 |
| බලපත්‍ර ගාස්තු | 303 | 208 | - |
| වෙනත් ආදායම් | 4,605 | 1,882 | 1,217 |

2.2.2 මුද්දර ගාස්තු

නැගෙනහිර පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගෙන ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන ආයතනවල නඩත්තු ඒකක සඳහා අවශ්‍ය මූලික යන්ත්‍ර සූත්‍ර ලබා දීමේ වැඩ සටහන සහ පළාත් පාලන ආයතනවල ප්‍රවාහන පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සභාවට ලබා දුන් වාහන 07 කට අදාලව අයිතිය සභාව වෙත පවරා ගැනීමට 2017 අගෝස්තු 03 දින වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු ධාවනයෙහි පවතින රථවාහන 05 ක් සඳහා ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඇ) සේවය හැරගිය සේවකයන් තිදෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු. 88,626 ක් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2017 අගෝස්තු 03 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

3.2.1 පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ඇතාබැඳිවැව ප්‍රධාන මාර්ගය ඉදිකිරීම - රු. 12,946,956
------------------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිවිසුම අනුව මෙම මාර්ගයෙහි ඉදිකිරීම් මාස 03 ක් ඇතුලත සම්පූර්ණ කල යුතුව තිබූ නමුත් මාස 09 ක් ගතවන තුරු ද, බොරළු දැමීම පමණක් සිදුකර තිබීම හේතුවෙන් 2012 නොවැම්බර් 26 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි.

(ආ) 2013 සැප්තැම්බර් 11 වන දින පැවති ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී ගනු ලැබූ තීරණයක් මත නැවත එම කොන්ත්‍රාත්කරු වෙත 2013 ඔක්තෝම්බර් 15 දින වන විට කාර්යය නිම කරන ලෙස දන්වා තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු විසින් 2013 ඔක්තෝම්බර් 07 දින වන විටද, මෙහි වැඩ ආරම්භ නොකිරීම හේතුවෙන් එදින නැවත ගිවිසුම අවලංගු කර තිබුණි.

(ඇ) නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකර මෙම මාර්ගය සඳහා පළමුව තාර යෙදීමට තීරණය කර තිබූ අතර, පසුව කිලෝමීටර් 1 ½ ක ප්‍රමාණයක් කොන්ක්‍රීට් යෙදීම හා කිලෝමීටර ½ ක ප්‍රමාණයක් තාර යෙදීමටත් තීරණය කර තිබුණි. එමෙන්ම නිවැරදි ලෙස ලංසු ඇගයීම් සිදුකර කොන්ත්‍රාත්කරුවකු තෝරා නොගැනීම හේතුවෙන් නැවත 2014 මාර්තු 13 වන දින රු. 18,826,970 ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර තිබුණි. මේ අනුව පළමු ගිවිසුම් මුදලට වඩා රු. 5,880,014 ක මුදලක් වැඩිපුර වියදම් දැරීමටද, මෙම කාර්යය වසර දෙකකට වැඩි කාලයක් ප්‍රමාද වී ඉටුකර ගැනීමටද සිදුව තිබුණි.

[

(ඈ) ප්‍රමිති ලංසු ලේඛන (SBD) 60.1 ප්‍රකාරව පළමු කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම අවලංගු කිරීමෙන් පසු එම කොන්ත්‍රාත්කරු විසින් සිදුකර ඇති වැඩ පිලිබඳ ඉංජිනේරුවරයා විසින් සහතික කල යුතු වුවද, එවැනි සහතික කිරීමක් සිදුකර නොතිබුණි. එමෙන්ම ගිවිසුම අවලංගු කර වසර දෙකකට පසු ගෙවීම් සඳහා රු. 5,022,257 ක් වටිනා බිල්පතක් ඉදිරිපත් කර තිබුණි. මෙම බිල්පත සම්බන්ධයෙන් වැඩබිම පරීක්ෂා කර වාර්තාවක් ලබා දෙන ලෙසට පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් 2017 මාර්තු 06 දින කමිටුවක් පත්කර තිබූ නමුත්,දෙවන කොන්ත්‍රාත්කරු විසින් එම මාර්ගයෙහි කොන්ක්‍රීට් යොදා නිම කොට 2014 සැප්තැම්බර් 30 වන දින සභාව වෙත භාර දී තිබුණි. එම නිසා මෙහි මිණුම් ලබාගත් ආකාරය පිළිබඳ ගැටළු සහගත විය. කෙසේ වුවද, ව්‍යාපෘති ඉංජිනේරුවරයා විසින් 2016 ජනවාරි 21 දින සහතික කරන ලද බිල්පත මත රු. 2,048,538 ක මුදලක් 2017 ජුනි 18 දින පළමු කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඉ) පළමු කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීමේ දී, දෙවන කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ බවට සහතික කොට ගෙවා තිබූ රු. 589,648 ක මුදල අඩු කොට නොතිබුණි.

(ඊ) කොන්ත්‍රාත් ගිවිසුම කඩ කිරීම හේතුවෙන් රජයට රු.මිලියන 07 කට වැඩි අලාභයක් සිදුව තිබියදී පළමු කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදුකිරීමේ දී ප්‍රමාද ගාස්තු ලෙස අඩුකරන ලද රු. 1,294,696 ක මුදල ප්‍රමිති ලංසු ලේඛන (SBD) 49.2 ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට ගෙවන ලෙස සහකාර ව්‍යාපෘති

අධ්‍යක්ෂකවරයා විසින් 2017 අප්‍රේල් 05 දින ප්‍රාදේශීය සභා ලේකම්වරයා වෙත දන්වා තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය සභාව විසින් 2017 අගෝස්තු 16 දින රු.1,000,000ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ නමුත්, ප්‍රමිති ලංසු ලේඛන (SBD) 49.2 හි ගිවිසුම අවලංගු කරන ලද කොන්ත්‍රාත්කරුගෙන් අඩු කරනු ලබන ප්‍රමාද ගාස්තු නැවත ගෙවීම් සම්බන්ධයෙන් කරුණු දක්වා නොතිබුණි.

(උ) ගිවිසුම කඩකරන ලද කොන්ත්‍රාත්කරුගේ රු. 647,347 ක් වටිනා කාර්ය සාධන බැඳුම්කරය 2014 ජනවාරි 30 වන දින සභාව විසින් මුදල් කර ගෙන තිබුණි.කෙසේ වුවද, සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් එම මුදල ප්‍රමිති ලංසු ලේඛන (SBD) 60.2 ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට නැවත ගෙවන ලෙස 2017 අප්‍රේල් 05 දින ලේකම්වරයාට දන්වා තිබුණි. ඒ අනුව සභාව විසින් 2017 මැයි 08 දින කාර්යය සාධන බැඳුම්කර මුදල වූ රු. 647,347 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කෙසේ වුවද, SBD 60.2 අනුව අවලංගු කරන ලබන කොන්ත්‍රාත් ගිවිසුම්වල කාර්යය සාධන බැඳුම්කරය නිදහස් කිරීම සම්බන්ධව කරුණු දක්වා නොතිබුණි.

3.2.2 පුර නැගුම ව්‍යාපෘතිය යටතේ බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම - රු. 8,401,836

---

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම ගොඩනැගිල්ලෙහි වැඩ නිමකර 2016 නොවැම්බර් 30 දින සභාව වෙත භාර දී තිබුණු නමුත් මෙහි වහලයෙහි එක් පැත්තක මීටර් 30 ක පමණ ප්‍රමාණයකට වැහිපීලි යෙදීම හා Ramp සකස් කිරීම සිදුකර නොතිබීම හේතුවෙන් වැසි දිනයන්හි දී ජලය පිටත බිත්තිය මතට රැස්ව තිබුණි.

(ආ) ගොඩනැගිල්ලෙහි පිටත බිත්තියෙහි වර්ග මීටර් 177 ක පමණ ප්‍රමාණයක තීන්ත ආලේප කිරීම හා ඇතුලත කාමර දෙකෙහි පොළවට ටයිල් ඇතිරීම 2017 අගෝස්තු 03 දින වන විටද සිදුකර නොතිබුණි.

(ඇ) ඉංජිනේරු ඇස්තමේන්තු ප්‍රකාරව ගොඩනැගිල්ල ඉදිකිරීමේ දි රු.265,148 ක් වටිනා වැඩ විෂයන් 03ක් ඉටු කර නොතිබුණි.

(ඈ) මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2016 සැප්තැම්බර් 12 දින දක්වා දින දීර්ඝ කිරීම් සිදුකර තිබුණි. නමුත් වැඩ නිම කිරීමේ සහතික පත්‍රයට අනුව කර්මාන්තය නිම කොට ඇත්තේ 2016 නොවැම්බර් 30 දින වේ. ඒ අනුව අයකල යුතු වූ ප්‍රමාද ගාස්තු වන රු. 327,671 ක මුදල අඩු කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2.3 මයිලකුඩා වැව ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම.

---

පුර නැගුම ව්‍යාපෘතිය යටතේ මයිලකුඩා වැව ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ දෙවන අදියර සඳහා රු. 4,000,280 ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුමක් 2016 ජූලි 08 වන දින අත්සන් කොට තිබු අතර කොන්ත්‍රාත්තුවෙහි කාර්යයන් 2016 ඔක්තෝම්බර් 08 දින වන විට අවසන් කළ යුතු වුවද, වැඩ නිම කිරීමේ සහතික පත්‍රයට අනුව නිමකොට තිබුණේ 2017 ජනවාරි 01 දින දීය. ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුමෙහි 6.4 ප්‍රකාරව අයකලයුතු ප්‍රමාද ගාස්තුව රු. 168,012 ක් වේ. කෙසේ වුවද, ඒ වෙනුවෙන් අඩුකර ඇත්තේ රු. 60,004 කි. මේ අනුව කොන්ත්‍රාත්කරුගෙන් අයකල යුතු ඉතිරි රු. 108,008 ක මුදල අඩු කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2.4 පුර නැගුම ව්‍යාපෘතිය යටතේ මහදිවුල්වැව කඩකාමර ඉදිකිරීම - රු. 1,843,000

-----------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම කඩකාමර 2016 නොවැම්බර් 08 දින සභාව වෙත භාර දී තිබූ නමුත් මෙහි බිත්ති ස්ථාන කිහිපයකින් පුපුරා ගොස් තිබුණි. එමෙන්ම මෙහි නාන කාමර දෙකක් සකස් කොට තිබූ නමුත් ඒ සඳහා Septic Tank ඉදිකොට නොතිබීම හේතුවෙන් ඒවා භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) ගිවිසුම් ප්‍රකාරව 2016 ඔක්තෝබර් 08 වන දින වැඩ නිම කල යුතු වුවද, වැඩ නිම කිරීමේ සහතික පත්‍රයට අනුව මෙය නිම කොට තිබුණේ 2016 නොවැම්බර් 08 දින වේ. මේ නිසා අයකල යුතු ප්‍රමාද ගාස්තුව වූ රු. 27,645 ක මුදල අඩු කිරීමට කටයුතු කර නොතිබුණි.

04. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. ගිණුම් තැබීම<br>ii. උපයෝගී ලෙජර පවත්වා ගෙන යාම |
| (ආ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අයකර ගැනීම<br>ii. උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | i. ගිවිසුම්ගත කාලය තුල කොන්ත්‍රාත් නිම කිරීමට කටයුතු කිරීම. |